ICRC

## ශ්‍රී ලංකාව

# ජනතාසේවය සහ ඔවුන් ආරක්ෂා කිරීම

**2018 ජුලි - සැප්තැම්බර්**



රාජ්‍යයක සන්නද්ධ සහ ආරක්ෂක හමුදා අතර නිතරම හා වඩාත්ම ජනතාව අතර දක්නට ලැබෙන්නේ පොලිස් නිලධාරීහුය. පොලිස් නිලධාරියෙකුට ප්‍රධාන වශයෙන් පැවරී ඇති කාර්යය වන නීතිය බලාත්මක කිරීමට පහත දැක්වෙන මූලික වගකීම් අයත්වෙයි: මහජන සාමය හා ආරක්ෂාව පවත්වාගෙනයාම, අපරාධ සෙවීම සහ වැලැක්වීම, ආධාර උපකාර සැලසීම සහ ජනතාවට සේවය කිරීම හා ඔවුන්ආරක්ෂා කිරීම.

ඔවුන්ගේ මෙහෙවර සපුරාලීම පිණිස නීතිය බලාත්මක කිරීමේ යෙදෙන නිලධාරීහු පහත දැක්වෙන මූලික බලයන් පාවිච්චි කරති: අත්අඩංගුවට ගැනීම, රඳවා ගැනීම, සෝදිසි කිරීම් සහ අල්ලා ගැනීම, බලය සහ ගිනිඅවි පාවිච්චි කිරීම. ඔවුන් මෙම බලයන් පාවිච්චි කරන අන්දම අනුව ජනතාව කෙරෙහි මහත් බලපෑමක් ඇතිවිය හැකිය. ඔවුන්ගේ මෙහෙයුම් ඔවුන්ගේ ජාතික නීති මගින් පාලනය වන අතර එය රාජ්‍යයේ ජාත්‍යන්තර මානව හිමිකම් පිලිබඳ වගකීම්වලට අනුරූපී විය යුතුය. ඔවුන්ට පුහුණුව සහ උපකරණ ලබාදීමේදී මෙය සැලකිල්ලට ගතයුතු අතර උදාහරණයක් දක්වන්නේ නම්, ඔවුන්ගේ උපකරණවලින් ක්‍රමක් ක්‍රමයෙන් ප්‍රතිචාරයක් දැක්වීමට හැකි අතර, අසලින් ගමන්කරන්නන්ට හානියක් සිද්ධවීම වැලැක්වීය යුතුය. එහෙයින් ආරක්ෂක හමුදා භාවිත කරන ඇතැම් අවි නීතිය බලාත්මක කිරීමට යෝග්‍ය නොවේ. පොලිස් නිලධාරීන්ට ආරක්ෂාවීමේ උපකරණ ලබාදීමෙන් ඔවුන්ට බලය පාවිච්චි කිරීමට ඇතිවන අවශ්‍යතාව අඩු කළ හැකිය.

ගැටුම්වලින් සහ ප්‍රචණ්ඩත්වයෙන් පීඩාවට පත් ජනතාව ආරක්ෂා කිරීමට සහ ඔවුන්ට ආධාර උපකාර කිරීමට ලැබී ඇති වරය අනුව කටයුතු කරමින් ජාත්‍යන්තර රතු කුරුස කමිටුව, පොලිස් බලකායට බලය හා ගිනිඅවි පාවිච්චි කිරීම, අත්අඩංගුවට ගැනීම්, රඳවා තබාගැනීම, සෝදිසි කිරීම සහ අල්ලා ගැනීම ගැන මනා අවබෝධයක් ලබාදෙයි. මෙම කරුණුවලට අනුව කිසිම තැනැත්තෙකු අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීමක් හෝ රඳවා ගැනීමක් නොවිය යුත්තේය. අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් බලපැවැත්වෙන රැකවරණ වලින් ප්‍රකාශ වන්නේ පොලීසිය අත්අඩංගුවට ගත් පුද්ගලයන්ට ගරුත්වයෙන් යුතුව මිනිසත්බව පෙරදැරිව සැලකිය යුතුබව, ඔවුන්ට එරෙහිව ඇති චෝදනා ඔවුන්ට දැනුම්දීම, අත්අඩංගුවට ගැනීමේදී ඔවුන්ට ඇති අයිතිවාසිකම් ගැන දැනුම්දීම, අත්අඩංගුවට ගැනීමේදී ඔවුන් නිර්දෝෂී බව උපකල්පනය කිරීම, අතුරුදහන් කිරීමෙන් සහ නීතියට පරිබාහිරව මරණයට පත්කිරීම් වලින් වැලකිය යුතු බවයි. අපරාධයක චූදිතයෙකු නම් රැඳවාගැනීමකදී තමන්ගේ නිදහස අහිමිවී ඇති පුද්ගලයන්ට කඩිනමින් අධිකරණය හමුවට ඉදිරිපත් කිරීමේ අයිතිය ඇත. ඔවුන්ට නීතිඥයෙකු සහ වෛද්‍ය වරයෙකු හමුවීමට සහ පුද්ගලයන් රඳවා තැබීමට නිල වශයෙන් පිහිටුවා ඇති ස්ථානයක රඳවා තැබීමට අයිතිය ඇත. බාහිර ලෝකය සහ තමන්ගේ පවුල් සමග සන්නිවේදනය පිණිස පහසුකම් සලසාදිය යුතු අතර තමන් රඳවා ගෙන සිටීමේ නීත්‍යානුකූලභාවය සම්බන්ධයෙන් ප්‍රමාදයකින් තොරව අභියෝග කිරීමට අයිතිය තිබිය යුතුයි. සාධාරණ කාලපරිච්ඡේදයක් තුළ සාධාරණ නඩු විභාගයක් පැවැත්විය යුතු අතර එසේ නොවන්නේ නම් ඔවුන් නිදහස් කළ යුතුයි. සෝදිසි කිරීම් සහ අල්ලා ගැනීම්වලදී, සෝදිසි කිරීම් නීත්‍යානුකූලව සිදුකළ යුතු අතර සෝදිසි කරනු ලබන පුද්ගලයන්ට ගරුත්වයෙන් සැලකිය යුතු අතර ඔවුන් ගේ දේපලවලට ගරු කළ යුතුය. පොලිස් බලකායට ප්‍රචණ්ඩ ක්‍රියා වැලැක්වීමට, නිරීක්ෂණය කිරීමට සහ අවශ්‍ය නම් දඩුවම් කිරීමට ක්‍රමයක් තිබිය යුතු බව ජාත්‍යන්තර රතු කුරුස කමිටුව අවධාරණය කරයි.

සෝදිසි කිරීම්වලට, අත්අඩංගුවට ගැනීම හා රඳවා ගැනීම සහ බලය හා ගිනි අවි පාවිච්චි කිරීමට අදාලවන පරිපාටිවල ජාත්‍යන්තර සම්මතයන් පිලිබඳව අවබෝධය ඉහල නැංවීමට ජාත්‍යන්තර රතුකුරුස කමිටුව පොලීසිය සඳහා සැසි පවත්වයි. පසුගිය සැප්තැම්බර් මාසයේදී පොලිස් කොස්තාපල්වරියන් සහ අලුතින් බඳවා ගන්නා ලද පිරිසක් ද ඇතුලු පොලීසියේ 700 දෙනෙකු වෙනුවෙන් අත්අඩංගුවට ගැනීමේ දී, රඳවා ගැනීම හා විමර්ශනවලදී පුද්ගලයන් සතු නීතියේ රැකවරණ, මූලික ආරක්ෂාවන් සහ සැලකීම පිලිබඳව සැසි පවත්වන ලදී. මෙම පුහුණු සැසි පොලිස් පුහුණු කිරීම් අංශය සමග සම්බන්ධීකරණයෙන් පවත්වනු ලැබේ.

# අපගේ දෛනික කාර්යයන්හිදී සුරක්ෂිත ප්‍රවේශය




ශාඛා විධායක නිලධාරීන්, වැඩසටහන් නිලධාරීන් සහ ස්වේච්ඡා සේවකයන් ඇතුලු ශ්‍රී ලකා රතු කුරුස සමාජයේ 28 දෙනෙකුට වැඩි පිරිසක් සුරක්ෂිත ප්‍රවේශය පිලිබඳ පුහුණු වැඩසටහනකට සහභාගිවූහ. එය සංවිධානය කරන ලද්දේ ජාත්‍යන්තර රතු කුරුස කමිටුව විසිනි.

ඉදිරිපත් කිරීම් සහ කණ්ඩායම් සාකච්ඡා මගින් ඔව්හු සුරක්ෂිත ප්‍රවේශ රාමුව පිලිබඳ සිය අවබෝධය වර්ධනය කරගත් අතර සුරක්ෂිත ප්‍රවේශය ප්‍රායෝගිකව මෙහෙයවීම සහ භාවිතය හුරුපුරුදු වූහ. දැනට පැවැත්වෙන අභ්‍යන්තර පුහුණු කිරීම් සහ වැඩසටහන්වලට වඩාත් යහපත් ආකාරයෙන් සුරක්ෂිත ප්‍රවේශ සැසි ඒකාබද්ධ කළ හැකි ආකාරය ගැන ඔවුහු සිය දැනුම ප්‍රගුණ කරගත්හ. එමෙන්ම පුහුණු කිරීමේ මොඩියුල සංවර්ධනය කර ගතහැකි ආකාරයද ඔව්හු ඉගෙන ගත්හ.







සුරක්ෂිත ප්‍රවේශයක් තිබීමෙන් අදහස්වන්නේ විශේෂයෙන් අභ්‍යන්තර ප්‍රචණ්ඩක්‍රියා හෝ නොසන්සුන්තාවන් හේතුකොට ගෙන උපකාර අවශ්‍ය තැනැත්තන් කරා ප්‍රවේශයක් ඇතිකර ගැනීමයි. එක් එක් තැනැත්තාගේ සහ සංවිධානයේ ආරක්‍ෂාව සලසා ගනිමින් එසේ කිරීමට හැකියාවක් ලැබීමද එයින් අදහස්වෙයි. ප්‍රවේශය වැදගත්වන්නේ එසේ නොමැති නම් උපකාර අවශ්‍ය ප්‍රජාවන්ට උපකාර කිරීමට නොහැකි වන හෙයිනි.

දිවයිනේ දිස්ත්‍රික්ක 25 හිම ශ්‍රී ලංකා රතු කුරුස සමාජයේ ශාඛා ඇත. පවුල් සබඳතා යලි ස්ථාපිත කිරීමට, ප්‍රථමාධාර සැපයීමට, ආපදා ප්‍රතිචාරයට සහ වැඩසටහන් ක්ෂේත්‍රවලට සුරක්ෂිත ප්‍රවේශය ඒකාබද්ධ කිරීමට සහ මානුෂවාදී අගයන් ප්‍රවර්ධනයට ජාත්‍යන්තර රතු කුරුස කමිටුව ජාතික සමාජයට ආධාර කරයි.



# අනාගත නීති කවයන් අතර ජාත්‍යන්තර මානුෂවාදී නීතිය ප්‍රවර්ධනය කිරීම




නීති උපාධි අපේක්ෂකයන් සඳහා 14 වැනි වාර්ෂික හෙන්රි ඩුනාන්ට් වාද උසාවි තරඟය සැප්තැම්බර් මාසයේදී කොළඹදී පවත්වන ලදී. සුදුසුකම් ලැබීමේ වටයට කණ්ඩායම් පහක් සහභාගිවූහ. ඉන් පසුව යාපනය විශ්ව විද්‍යාලයේ නීති අංශයේ කණ්ඩායම සහ කොළඹ විශ්ව විද්‍යාලයේ නීති පීඨයේ කණ්ඩායම අවසන් තරගයට සහභාගිවූහ. මෙම කණ්ඩායම් උපකල්පනය කළ නඩුවක් ලෙස බ්‍රිගේඩියර් පී. කුමනෝවා ට එරෙහිව ජාත්‍යන්තර අපරාධ අධිකරණය හමුවේ මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ සහ යුද අපරාධ නඩුවක් තර්ක කළහ.

විත්තිය සහ පැමිණිල්ල වෙනුවෙන් නිවේදන පත්‍ර සහ කරුණු ඉදිරිපත් කිරීම්වලින් පසුව ජාත්‍යන්තර මානුෂවාදී නීතිය පිළිබඳ ත්‍රී පුද්ගල විනිශ්චය මණ්ඩලයේ තීරණය අනුව ජය අත්වූයේ කොළඹ විශ්ව විද්‍යාලයේ කණ්ඩායමටයි. ජයග්‍රාහී කණ්ඩායම සහ දෙවැනි ස්ථානයට පත් යාපනය විශ්ව විද්‍යාලයේ කණ්ඩායම ලබන දෙසැම්බර් මාසයේ ඉරානයේ ටෙහෙරාන් නුවර පැවැත්වෙන කලාපීය වාද උසාවි තරඟයට සහභාගී වෙති.







නීතිය හදාරන උපාධි අපේක්ෂකයන් අතර ජාත්‍යන්තර මානුෂවාදී නීතිය ප්‍රවර්ධනය කිරීම පිණිස ජාත්‍යන්තර රතු කුරුස කමිටුව සහ කොළඹ විශ්ව විද්‍යාලයේ නීති පීඨය වාර්ෂිකව හෙන්රි ඩුනාන්ට් වාද උසාවි තරඟය සංවිධානය කරයි.

කොළඹ විශ්ව විද්‍යාලයේ ජයග්‍රාහී කණ්ඩායම: ප්‍රසාන්ති විග්නනාන්ත, විශ්මි අබේවර්ධන සහ ෂෙලනි පලිහවඩන ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ ආරක්ෂණ සම්බන්ධීකාරක බෲනෝ ඊේමන්ඩ් වෙතින් පලිහ ලබා ගනිති. ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ නීති උපදේශක සමින්දිකා ඇල්කඩුව මහත්මියද මෙහි සිටී.



# තොරතුරු සහ දත්ත විස්තර

## 2018 ජූලි - සැප්තැම්බර්

### අතුරුදහන් තැනැත්තන්ගේ පවුල්වල අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීම

පුද්ගලයන් සොයාගැනීම පිණිස කළ විමසුම්වල පසුවිපරුම පිණිස පවුල් 1,380 ක් මුණ ගැසුණු අතර පුද්ගලයන් අතුරුදහන්වීමේ නව සිද්ධි 62 ක් ලියාපදිංචි කිරීම; අතුරුදහන් පුද්ගලයන් 700 දෙනෙකුගේ පමණ ඥාතීන්ට මනෝ සමාජීය ආධාර සැසි පැවැත්වීම; (සහායක වැඩසටහන මගින්) තම ජීවනෝපායන් දියුණු කරගැනීම පිණිස පවුල් 263 කට මුදල් ආධාර ලබාදීම.

### රැඳවියන්ගේ සුබසාධනය

රටෙහි විවිධ ස්ථානවදී රැඳවියන් 222 දෙනෙකු මුණගැසීම සහ සොයාගත් කරුණු සහ නිර්දේශ බන්ධනාගාර බලධාරීන් සමග රහසිගතව හුවමාරු කරගැනීම; රැඳවුම්භාරයේ පසුවන ස්වකීය ඥාතීන් හමුවීමට යාම පිණිස 88 දෙනෙකුට ගමන් වියදම් දීමනාවක් ගෙවීම; අධ්‍යාපන සහ විනෝදය පිණිස අයිතම වශයෙන් රැඳවියන් 3,433 දෙනෙකුට අවශ්‍ය ආධාර කිරීම්.
මඩකලපුව සහ ත්‍රිකුණාමලයේ බන්ධනාගාරවලට නඩත්තු උපකරණ පරිත්‍යාග කිරීම සහ මුළුතැන්ගෙවල් දියුණු කිරීම පිණිස වව්නියාව සහ ත්‍රිකුණාමලයේ බන්ධනාගාරවලට ඉදිකිරීම් ද්‍රව්‍ය සැපයීම.

### ජාත්‍යන්තර මානුෂවාදී නීතිය ප්‍රවර්ධනය කිරීම

සාම ආධාරක මෙහෙයුම්වලට ජාත්‍යන්තර මානුෂවාදී නීතියේ අදාලත්වය සහ ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ භූමිකාව සහ වරය ගැන මාලි රාජ්‍යයේ සේවය පිණිස යැවීමට නියමිත යුද හමුදාවේ 345 දෙනෙකු වෙනුවෙන් ඔවුන් පිටත්ව යාමට පෙර කරුණු විස්තර කරදීම; ආරක්ෂක හමුදා මූලස්ථානයේදී (නැගෙනහිර) යුද හමුදා නිලධාරීන් 25 දෙනෙකු සඳහා ජාත්‍යන්තර මානුෂවාදී නීතිය සහ ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය පිළිබඳ දෙදින සම්මන්ත්‍රණයක් පැවැත්වීම. ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ ජාත්‍යන්තර නීතිය සහ ප්‍රතිපත්තිය පිළිබද නියෝජ්‍ය අධ්‍යක්ෂ ඊවා සොබෝදා මහත්මිය ලෝකයේ විවිධ රටවලින් නියෝජිතයන් සහභාගිවූ කොළඹ වාර්ෂික ආරක්ෂක සමුළුවේදී අභ්‍යන්තර වශයෙන් පුද්ගලයන් අවතැන්වීමේ අභියෝග සම්බන්ධයෙන් කතා කළාය. බලය සහ ගිනිඅවි පාවිච්චි කිරීම සහ රඳවා ගැනීම් සම්බන්ධයෙන් සිංහල කොස්තාපල්වරියන් 610 දෙනෙකු සහ දෙමල කොස්තාපල්වරියන් 20 දෙනෙකු වෙනුවෙන් කළුතර පොලිස් විද්‍යාලයේදී පුහුණු වැඩසටහනක් පැවැත්වීය; බලය සහ ගිනිඅවි පාවිච්චි කිරීම සහ රඳවා ගැනීම් සම්බන්ධයෙන් පොලිස් ස්ථානාධිපතිවරුන්, අපරාධ ස්ථානාධිපතිවරුන් සහ ළමා හා කාන්තා කාර්යාංශයේ පොලිස් නිලධාරීන් 125 දෙනෙකු සදහා එක්දින පුහුණු වැඩසටහනක් පැවැත්වීය.

### ශ්‍රී ලංකා රතු කුරුස සමාජයට ආධාර කිරීම

ශ්‍රී ලංකා රතු කුරුස සමාජයේ කාර්ය මණ්ඩලයේ සහ දිස්ත්‍රික් ශාඛාවල ස්වේච්ඡා සේවකයන් 55 දෙනෙකු ආපදා ප්‍රතිචාර ශිල්පක්‍රම ගැන පුහුණු කරනු ලදි; දිස්ත්‍රික්ක මට්ටමේ උත්සවවලදී ප්‍රථමාධාර කඳවුරු හතක් පැවැත්වීම; දීප ව්‍යාප්ත ප්‍රථමාධාර විභාගයට සහභාගිවීමෙන් ස්වේච්ඡා සේවකයන් 215 දෙනෙකු ඔවුන්ගේ ප්‍රථමාධාර කුසලතා වර්ධනය කරගැනීම; අනුරාධපුරය සහ පුත්තලම දිස්ත්‍රික්කවල නියඟයෙන් පීඩාවට පත් පවුල් සදහා ජල බඳුන් 2,000 ක් බෙදාදීම. මානුෂවාදී ප්‍රතිපත්ති සහ රතු කුරුස සහ රතු අඩසඳ ව්‍යාපාරය ගැන ශ්‍රී ලංකා රතු කුරුස සමාජයේ"දිස්ත්‍රික් ශාඛා මගින් පාසල් සිසුන් සහ වෘත්තිකයන් වෙනුවෙන් ප්‍රචාරණ සැසි තුනක් පවත්වන ලදී.
හදිසි අවස්ථාවන්හිදී ප්‍රතිචාර දැක්වීමේදී ගතයුතු ක්‍රියා මාර්ග සහ පියවරවල් සම්බන්ධයෙන් කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් සහ ස්වේච්ඡා සේවකයන් 28 දෙනෙකු ඉගෙන ගත් අතර එමගින් ඔවුන් තමන්ගේ ආරක්ෂාව සහතික කරගැනීමද සිදුවෙයි.

**ජාත්‍යන්තර රතු කුරුස කමිටුව**
29, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 5
ශ්‍රී ලංකාව
දුරකථන +94 (11) 250 33 46  ෆැක්ස් +94 (11) 250 33 48
ඊ මේල් : colombo@icrc.org
වෙබ් : www.icrc.org

**වව්නියාව කාර්යාලය**
70, වයිරවර් කෝවිල පාර, වයිරවර්පුලියන්කුලම්
වව්නියාව
දුරකථන +94 (0) 24 222 28 55   ෆැක්ස් +94 (0) 24 222 28 37

**මඩකලපුව කාර්යාලය**
මන්රීසා පාර
කොතුකුලම්, පිලයාරඩි
මඩකලපුව
දුරකථන +94 (0) 65 222 70 70
©ජාත්‍යන්තර රතු කුරුස කමිටුව, ජනවාරි 2018

facebook.com/icrc
twitter.com/icrc
instagram.com/icrc

ICRC

2018.0624/002 10.2018 150